ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2020
---------------------------------------------------------------------------------------------------

ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**
---------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය, නාවික කටයුතු හා මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන ජාතික මාර්ග 13ක කිලෝමීටර් 65.45ක් වැඩිදියුණු කිරීම හා නාරාහේන්පිට-නුගේගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 12,347.37කට සමාන එ.ජ.ඩො. මිලියන 94.99ක් වන අතර ඉන් රු. මිලියන 6,499.57කට සමාන එ.ජ.ඩො.මිලියන 50ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 දෙසැම්බර් 11 දින ආරම්භ කරන ලද අතර 2017 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිත විය. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය 2022 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**
----------------------------------

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දැක්වෙන කරුණු වලින් වන බලපෑම හැර,ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**
--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂ අවසානයට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන ණය ශේෂය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ | 248 | රු. 247,901,338.53ක ඉතිරි මුදල 2020 වර්ෂය සඳහා ලැබිය යුතු විදේශ | ගිණුම් වර්ෂය අවසානයට නිවැරදි ණය ශේෂය දැක්වීමට |

| | | | | |
|---|---|---|---|---|
| | වාර්තාවේ දැක්වෙන ණය ශේෂය අතර වෙනස සංසන්දනය කර නොතිබුණි. | | ආධාර ලෙස ගිණුම්ගත කර තිබුණි. | සත්‍ය වියපැහැදම්වීම් වාර්තා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | **2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමියන්ට ගෙවිය යුතු වන්දි ගෙවීම් ප්‍රමාදවීම් මත ගෙවිය යුතු පොළිය ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.** | **185** | පිළියන්දල - මහරගම මාර්ගය සඳහා රු.**34,613,956.13** ක් හා වල්ගම- දියගම මාර්ගය සඳහා රු. **13,451,417.35** ක් පොළී වෙන් කිරීම් ලෙස ජ'නල් වවුචර් අංක **80** මගින් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් වර්ෂය අවසාන දිනට වන්දි ගෙවීම් නිරවුල් කිරීමේ ප්‍රමාදය මත ගෙවිය යුතු පොළිය නිවැරදිව වාර්තා කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | **2020** දෙසැම්බර් මාසය සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ අන්තර් ගෙවීම් සහතික **04**කට අදාළ වෙන්කිරීම් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන තුළ අඩුවෙන් දක්වා තිබුණි. | **11.63** | යොමුගත **2020** දෙසැම්බර් මාසය සඳහා අන්තර් ගෙවීම් සහතික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය වෙත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසු ලැබී තිබුණි. එම නිසා, ඉහත අන්තර් ගෙවීම් සහතික සඳහා රු. මිලියන **84.0**ක වෙන්කිරීමක් සිදු කර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක **08** සමග අනුකූලවීමට පියවර ගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| | සංරචකය | **2020** දෙසැම්බර් **31** දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | අත්කරගත් කාර්යසාධනය ප්‍රතිශතය | විගණන ගැටලු | ප්‍රමායන් සඳහා හේතු |
|---|---|---|---|---|---|
| (අ) | කොට්ටාව- තලගල මාර්ගය | **100%** | **70%** | මාර්ග ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය අපේක්ෂිත ප්‍රගතියට පිටුපසින් පැවතුණි. මෙය ව්‍යාපෘතිය ප්‍රමාදවීමට සහ ව්‍යාපෘතියේ පිරිවැය ඉහළ යාමට බලපානු ලැබේ. | ඉඩම් අත්කර ගැනීමේ ගැටලු සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාදවේ. |
| (ආ) | කෝට්ටේ - බෝපේ මාර්ග | **100%** | **99%** | | |
| (ඇ) | ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය **(අදියර 1)** | **100%** | **48%** | | |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ඔරුගොඩවත්ත- අඹතලේ මාර්ගය (අදියර 1) | 61% | 38% |

කළමණාකරනයේ ප්‍රතිචාර -එකගවේ-

විගණකගේ නිර්දේශ ඉලක්කගත දිනයන්ට ඉදිකිරීම් කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගත යුතුය.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පළමු අදියරේ පුනරුත්ථාපන කටයුතු 2017 ජූලි 01 දින ආරම්භ කළ අතර, ප්‍රමාද ගාස්තු අයකිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරුට දින 478ක කාලය දීර්ඝ කිරීමක් ලබාදී තිබුණි. තවද, කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය සැලකීමකින් තොරව දින 175ක දීර්ඝ කිරීමක් සඳහා රු. මිලියන 17.41ක වන්දි මුදලක් අනුමත කර තිබුණු බව නිරීක්ෂණය විය. | එකඟ වේ. | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අනුව ප්‍රමාද ගාස්තු අඩුකර ගැනීමේ අරමුණින් කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය කාලීනව ඇගයීමට පියවර ගත යුතුය. |
| (ආ) | ලැබී තිබුණු තොරතුරු අනුව, කොට්ටාව - තලගල මාර්ගය සහ කෝට්ටේ - බෝපේ මාර්ගයේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත් කාලය දින 550 සහ දින 661කින් දීර්ඝ කර තිබුණි. ප්‍රමාද කාලය මත වන්දි සඳහා රු.මිලියන 59.28ක් සහ රු.මිලියන 72.18 ක් අනුමත කර තිබුණි. | එකඟ වේ. | අනවශ්‍ය කොන්ත්‍රාත් පිරිවැය අඩුකර ගැනීමට ඉදිකිරීම් කටයුතු නිසි පරිදි සැලසුම් කිරීමට අවශ්‍ය වේ. |
| (ඇ) | රක්ෂණ ආවරණය වලංගු කාලය 2020 දෙසැම්බර් 31 දින අවසන් වේ. කෙසේවෙතත්, ඉදිකිරීම් කාලය තුළ ඇතිවන අවධානම්වලින් ආරක්ෂාවීමට රක්ෂණ ආවරණයේ වලංගු කාලය දීර්ඝ කිරීමට කොන්ත්‍රාත්කරු විසින් පියවර ගෙන නොතිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට මහජන පැමිණිලි 34 නොවිසඳා පැවතුණු බව නිරීක්ෂණය විය. | එකඟ වේ. | ව්‍යාපෘතියේ සිවිල් කටයුතු නිමවීමට පෙර සියලුම මහජන පැමිණිලි අවසන් කිරීමට පියවර ගත යුතුය. |

**3.3 ඉඩම් අත්පත් කර ගැනීම් පිළිබඳ ගැටලු**

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| ලැබී තිබුණු තොරතුරු අනුව,රජයේ ඉඩම් කොටස් 911 ඇතුලුව ඉඩම් කොටස් 5,493ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා වන්දි ගෙවීම් නිරවුල් කිරීමේ ප්‍රමාදය මත රු.මිලියන 1,175ක පොළිය ඇතුලුව රු.මිලියන 9,656ක වන්දි මුදලක් දරා තිබුණි. කෙසේවෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ ඉඩම් කොටස් 5ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. තවද, ව්‍යාපෘතියේ අරමුදල් පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එකතුව රු.මිලියන 1,178ක වන්දි ගෙවීමේ වවුචර්පත් ව්‍යාපෘතිය සතුව පැවතුණි. | අත්පත් කර ගැනීමට නියමිත ඉඩම් ප්‍රමාණය විස්තර හැර සපයන ලද විස්තර නිවැරදි වේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ ඉඩම් ලියාපදිංචි කිරීමට පියවර ගත යුතුවේ. |